# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1447/15 – 2006 මැයි 31 වැනි බදාදා – 2006.05.31

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල් ඩී. බී. 4/78.

**1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත**

1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 24 වන වගන්තිය යටතේ ව්‍යවසාය සංවර්ධන සහ ආයෝජන ප්‍රවර්ධන ආමාත්‍යවරයා සෑදූ නියෝග.

රෝහිත බෝගොල්ලාගම,
ව්‍යවසාය සංවර්ධන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2006 මැයි මස 16 වන දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2006 අංක 1 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නියෝග ලෙස හැඳින්වේ.

2. (1) 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත මගින් පිහිටුවන ලද (මින් මතු මණ්ඩලය යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් එසේ කිරීම උචිත යයි මණ්ඩලය විසින් සලකනු ලබන්නේ නම් එය විසින් ඉහත පනතේ 17 වන වගන්තිය යටතේ යම් ව්‍යවසායක් සමඟ ඇතුල් වන යම් ගිවිසුමක 2002 ජුනි 28 වන දින දරන අංක 1242/29 දරන *අතිවිශේෂ ගැසට්* පත්‍රයේ පළවූ නියෝග මගින් අවසන් වරට සංශෝධිත 1978 ඔක්තෝබර් මස 31 වන දින අංක 8/2 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළවූ 1978 අංක 1 දරන නියෝගවල විධිවිධානවලට අමතරව, මේ නියෝගවල 'අ', 'ආ' සහ 'ඇ' කොටස්වල සඳහන් විධිවිධාන අන්තර්ගත කරනු ලැබිය හැකිය.

(2) එහි සවිස්තරික ක්‍රියාකාරකම්වලට සම්බන්ධ සහ අදාළ මණ්ඩලය විසින් දුෂ්කර නොවන හෝ දුෂ්කර හෝ ඉතා දුෂ්කර පෙදෙස් ලෙස නම් කෙරුණු පෙදෙසක ව්‍යාපාරයක් පිහිටුවන ව්‍යවසායකට 'අ' කොටසේ හෝ 'ආ' කොටසේ හෝ 'ඇ' කොටස් විධිවිධාන අදාළ විය යුතු ය.

3. ප්‍රදානය කරන ලද ඉහත සඳහන් සහන කාලසීමාව ගතවීමත් සමඟ 'අ' කොටසේ හෝ 'ආ' කොටසේ හෝ 'ඇ' කොටසේ සඳහන් ඕනෑම ව්‍යවසායක් තවද, වසර දෙකක (02) කාලසීමාවක් එලෙස ලාභ සහ ආදායම් පිළිබඳ ආදායම් බද්දෙන් සහන ලැබූ වසරේ අවසන් දිනය ගෙවෙනවාත් සමඟම එබඳු ව්‍යවසායක ලාභ සහ ආදායමෙන් සියයට දහයක (10%) ආදායම් බද්දක් හැම තක්සේරු වසරක් සඳහාම අයවිය යුතුය.

එබඳු ව්‍යාවසායකින් ඉන් පසු (අපනයන දිශානත කර්මාන්තයක් හෝ අපනයන දිශානත සේවයක යෙදී සිටින ව්‍යාවසායක් හැර ඕනෑම තක්සේරු වසරක් සඳහා සියයට විස්ස (20%) ගණනේ ආදායම් බද්ද අය කළ යුතු ය. අපනයන දිශානත කර්මාන්තයකින් හෝ අපනයන දිශානත සේවාවක යෙදෙන ව්‍යාවසායකින් සියයට පහළොව (15%) ගණනේ ඕනෑම තක්සේරු වසරක් සඳහා අදායම් බද්ද අයකළ යුතුය.

4. 'අ' කොටසේ 'ආ' කොටසේ හා 'ඇ' කොටසේ නිශ්චිත ලෙස සඳහන් කොට ඇති අවම ආයෝජන යම් ගොඩනැගිල්ලක් මිලදී ගැනීම හෝ ඉදිකිරීම සඳහා හෝ යම් පිරියත යන්ත්‍රෝපකරණ හෝ උපකරණ මිලදී ගැනීම හෝ සඳහා භාවිතා කළ යුතු ය.

5. ශ්‍රී ලංකාවේ යම් ව්‍යාවසායක් විසින් විකුණනු ලබන සියලු නිමිභාණ්ඩ, ඒවා (එනම් අමුද්‍රව්‍යවල අඩ නිමි නිෂ්පාදන හෝ වෙනත් යෙදවුම්) සෑදීමේ දී නිෂ්පාදනය කිරීමේ දී හෝ සැකසීමේ දී භාවිත කරනු ලැබූ සියළු ද්‍රව්‍ය හෝ ඒවායේ සංඝටක ඒ ව්‍යාවසාය විසින් රේගු බදු රහිතව ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද්දේ නම්, එකී භාණ්ඩ විකිණීමේ දී රේගු ආඥාපනතේ (235 වන අධිකාරය) 10 වන වගන්තිය ප්‍රකාර රේගු බද්දක් පනවා අය කළ යුතු ය.

6. මේ නියෝගවල කාර්යය සඳහා -

ගොවිතැන යන්නට, ඉඩමක ඕනෑම වර්ගයක පැලෑටි සහ ගස් වගා කිරීම, මාළු බෝ කිරීම් හෝ සැකසීම සහ දියුණු තාක්ෂණය සහ සම්බන්ධ ගොවිතැන, බෙදාහැරීම, රැස්කිරීම සහ විකිණීම, සපයා ගැනීම, ගබඩා කිරීම, ශීතකාමර, අයිස් යන්ත්‍ර, කිරිපට්ටි පාලනය, කුකුළන් හා සත්ව පාලනය අංකුර ක්‍රම සහ පැළ සහ තවාන සහ කළු තේ සැකසීම හැර දේශීය ආයෝජකයන් විසින් පෙර පසු අස්වනු කළමනාකරණය සඳහා භාවිත කරගනු ලබන දියුණු තාක්ෂණය ද ඇතුළත් වේ.

"පවතින ව්‍යාවසාය" යනු නව ව්‍යාවසායක් නොවන ව්‍යාවසායක් වේ.

භාණ්ඩ යනු ආහාර, බීම වර්ග පානයන්, රෙදිපිළි නිමි ඇඳුම් සහ සම්භාණ්ඩ, ලී සහ ලී බඩු, කඩදාසි, කඩදාසි භාණ්ඩ මුද්‍රණය සහ ප්‍රකාශනය, රසායනික ද්‍රව්‍ය ඛණිජ තෙල්, ගල්අඟුරු රබර් සහ ප්ලාස්ටික්, ලෝහ නොවන ඛනිජ ද්‍රව්‍ය, තනාපු ලෝහ, කාර්මික උපකරණ, යන්ත්‍රෝපකරණ සහ ප්‍රවාහන ආම්පන්න හා ඔරු සහ ධීවර ආම්පන්න සෑදීම ඇතුළත් වන අතර, කළු තේ තොග, ක්‍රේප් රබර්, ෂීට් රබර්, ස්ක්‍රැප් රබර්, පොල් තෙල්, වියළි පොල් (අඛණ්ඩව ස්වයංක්‍රීය පරිසැකසුම් තාක්ෂණය භාවිතයෙන් සාදන ලද වියළි පොල් හැර) කොප්පරා, අලුත් පොල්, පොල් කොහු හෝ මණ්ඩලය තීරණය කරන එබඳු වෙනත් භාණ්ඩ ඇතුළත් නොවේ.

'දේශීය ආදායම් පනත' යන්නෙන්, 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත අදහස් වන අතර, ඒ වෙනුවට පනවනු ලබන වෙනත් යම් පනතක් ඇතුළත් වේ.

'නව ව්‍යාවසාය' යන්නෙන් අලුත් ව්‍යාවසායක් අදහස් කෙරේ. ශ්‍රී ලංකාව තුළ පවතින ව්‍යාවසායකින් කවර හෝ විස්තරයක වත්කම් පැවරීම හෝ පවතින ව්‍යාපාරයක් ප්‍රතිනිර්මාණය කිරීම අදහස් නොවිය යුතු ය. ගිලන් කර්මාන්තයක වත්කම් පවරා ගැනීම ප්‍රතිනිර්මාණයක් ලෙස නොසැලකිය යුතු ය.

"සේවාවන්වලට තොරතුරු තාක්ෂණය සහ තොරතුරු තාක්ෂණයෙන් කෙරෙන සේවා/ව්‍යාපාරය ක්‍රියායන පිටකරන කර්මාන්තය, සංචාරක ව්‍යාපාරය විශ්‍රාන්තිය, අපනයන දිශානත සේවා (වක් අපනයන) ඇතුළු ඇඳුම් සෝදන සහ නිම කිරන යන්ත්‍ර, විසිතුරු ගෙතුම් සේවා, රෙදි සහ ඇඳුම් මුද්‍රණය, රෙදිපිළි පරීක්ෂණය. ඇඳුම් සහ වෙනත් කර්මාන්තවලට පරිඝනක මගින් සැකසූ මෝස්තර,. ඇඳුම් රික්ත පොදි කිරීම හෝ මණ්ඩලය අනුමත කළ වෙනත් සේවයක්.

"ගිලන් කර්මාන්තය" යන්නෙන් මණ්ඩලයට ඉල්ලීමක් ඉදිරිපත් කළ දින සිට අවසන් තක්සේරු වර්ෂයට පෙරාතුව වර්ෂ 2 ක කාලසීමා තුළ කවර හෝ තක්සේරු වර්ෂයක් සඳහා ස්වකීය ගණුදෙනුවලින් අඛණ්ඩව ලාභ නොලැබූ පවතින ව්‍යාවසායක් හෝ ඉල්ලීමේ දිනට පෙරාතුව යටත් පිරිසෙයින් මාස හයක් (06) නොමෙහෙයවුනු හෝ පවතින ව්‍යාවසායයන් අදහස් වේ.

මණ්ඩලය විසින් දුෂ්කර නොවන ප්‍රදේශයක් ලෙස නම් කරනු ලැබූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක (කොළඹ හා ගම්පහ දිස්ත්‍රික් හැර) ව්‍යාපාරයක් පිහිටුවන ව්‍යාවසායකට පහත දැක්වෙන 1 - 9 දක්වා වූ අයිතම අදාළ වේ.

## අ කොටස

1. රුපියල් මිලියන තිහක (රු. 3,00,00,000) අවම ආයෝජනයක් සහිත පහත දැක්වෙන 1 වන තීරුවේ අනුරූපිත සටහනෙහි සවිස්තරික දේශීය පුද්ගලයන් ගණනක් 2006 අප්‍රේල් 1 වන දින සිට දෑවුරුදු (02) කාලයක් සේවයේ යොදවන (ඇහලුම් හැර) භාණ්ඩ නිපදවීමට හෝ සෑදීමට හෝ සේවා සැපයුමට ව්‍යාපාරයක් පිහිටුවන නව ව්‍යාවසායක ලාභ සහ ආදායම් කෙරෙහි පහත දැක්වෙන 11 වන තීරුවේ සවිස්තරික කාලසීමාවකට ආදායම් බදු පැනවීම, ගෙවීම හා අයකිරීමට අදාළ දේශීය ආදායම් පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

| *1වන තීරුව සේවකයන්ගේ ගණන* | *11 තීරුව සහන කාලසීමාව* |
|---|---|
| 200 හෝ ඊට වැඩි | වසර 05 |
| 100 - 199 | වසර 03 |
| 50 - 99 | වසර 02 |

එකී සහන කාලසීමාව එම ව්‍යවසාය ලාභ ලැබීම අරඹන වසරේ සිට හෝ වෙළඳ මෙහෙයුම් අරඹන දින සිට වසර දෙකක් (02) තුළ යම් තක්සේරු වසරක් යන දෙකින් වඩා කලින් යෙදෙන වසර සිට ගණන් බැලිය යුතු ය.

2. (ඇහලුම් හැර) භාණ්ඩ නිෂ්පාදනය හෝ සැදීම හෝ සඳහා රුපියල් මිලියන තිහකට (රු. 3,00,00,000) නොඅඩු ආයෝජනයක් සහිතව, 2006 අප්‍රේල් 1 වන දින සිට අවුරුදු 2 ක කාලයක් දේශීය වෙළඳ පොළට සේවා සැපයීම පිණිස යම් ගිලන් කර්මාන්තයක් ඒ කර්මාන්තයේ වත්කම් හා සේවකයන් ද සමඟ පවරා ගනු ලබන සහ එකී ගිලන් කර්මාන්තයේ දැනට සිටින සේවකයන් ගණන හෝ දෙසීයකට නොඅඩු (200) දේශීය පුද්ගලයන් හෝ යන දෙකින් වැඩි ප්‍රමාණයක සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන නව ව්‍යවසායයක ලාභ හා ආදායම් කෙරෙහි අවුරුදු තුනක (03) කාලයක් සඳහා ආදායම් බදු පැනවීම ගෙවීම හා අයකර ගැනීමට අදාළ දේශීය ආදායම් පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

එකී සහන කාලසීමාව එම ව්‍යවසාය ලාභ ලැබීම අරඹන වසරේ සිට හෝ වෙළඳ මෙහෙයුම අරඹන දින සිට වසර දෙක (2) නොඉක්මවන කලින් යෙදෙන කොයි එක හෝ යම් තක්සේරු වසරක් අනුව ගිණිය යුතුය.

3. රුපියල් මිලියන තිහක (රු. 3,00,00,000) අවම ආයෝජනයක් සහිත, 2006 අප්‍රේල් 1 වන දින සිට වසර දෙකක (2) කාලසීමාවක් තුළ දේශීය පුද්ගලයන් දෙසීයක් හෝ ඊට වැඩි ගණනක් සේවයේ යොදවමින් සිය නිෂ්පාදනයෙන් සියයට අසූවකට (80%) නොඅඩු ප්‍රමාණයක් අපනයනය කරන ඇඳුම් සාදන ව්‍යාපාරයක ලාභ හා ආදායම් කෙරෙහි අවුරුදු පහක (05)ක කාලසීමාවකට ආදායම් බදු පැනවීම, ගෙවීම සහ අයකිරීම පිළිබඳ දේශීය ආදායම් බදු පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

එකී සහන කාලසීමාව එම ව්‍යවසාය ලාභ ලැබීම අරඹන වසරේ සිට හෝ වෙළඳ මෙහෙයුම් අරඹන දින සිට වසර දෙක (2) නොඉක්මවන කාලයක් ඇතුළත යම් තක්සේරු වර්ෂයක් හෝ යන දෙකින් කලින් එළඹෙන වසරේ සිට ගණන් බැලිය යුතු ය.

4. ගිලන් කර්මාන්තයක් ඒ ගිලන් කර්මාන්තයේ වත්කම් සහ සේවකයන් සහිතව භාණ්ඩ නිපදවීමට හෝ සැදීමට හෝ සේවා සැපයුමට පවරාගන්නා රුපියල් මිලියන තිහක (රු. 3,00,00,000) අවම ආයෝජනයක් සහිතව, 2006 අප්‍රේල් 1 වන දින සිට වසර දෙකක (2) කාලසීමාවක් තුළ දේසීයක් හෝ ඊට වැඩි ගණනක් දේශීය පුද්ගලයන් සේවයේ යොදවමින් එහි නිෂ්පාදිතයෙන් සියයට අසූවකට (80%) නොඅඩු ප්‍රමාණයක් සහ සැදූ භාණ්ඩ සහ සේවා සැපයුමෙන් සියයට හැත්තෑවකට (70%) නො අඩු ප්‍රමාණයක් අපනයනය කරනු ලබන නව ව්‍යවසායක ලාභ සහ ආදායම් කෙරෙහි වසර පහක කාලසීමාවකට (05) ආදායම් බදු පැනවීම, ගෙවීම සහ අයකිරීම පිළිබඳ දේශීය ආදායම් බදු පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

එකී සහන කාලසීමාව ඒ ව්‍යවසාය ලාභ ලැබීම අරඹන වසරේ සිට හෝ වෙළඳ මෙහෙයුම අරඹන දින සිට වසර දෙක (2) කාල සීමාවක් තුල යම් තක්සේරු වසරක් යන දෙකින් වඩා කලින් යෙදෙන වසර සිට ගණන් බැලිය යුතු ය.

5. රුපියල් මිලියන පහළොවක (රු. 1,50,00,000) අවම ආයෝජනයක් සහිත 2006 අප්‍රේල් 1 වන දින සිට වසර දෙකක (2) කාලසීමාවක් තුළ දේශීය පුද්ගලයන් විසිදෙනෙකු (20) සේවයේ යොදවන, කෘෂි ව්‍යාපාරයක් කරගෙන යනු ලබන නව ව්‍යවසායක ලාභ සහ ආදායම් කෙරෙහි වසර පහක (05) කාලසීමාවකට ආදායම් බදු පැනවීම, ගෙවීම සහ අයකිරීම පිළිබඳ දේශීය ආදායම් බදු පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

එකී සහන කාලසීමාව ඒ ව්‍යවසාය ලාභ ලැබීම අරඹන වසරේ සිට හෝ වෙළඳ මෙහෙයුම් අරඹන දින සිට වසර දෙකක කාලසීමාවක් තුළ යම් තක්සේරු වසරක් යන දෙකින් වඩා කලින් යෙදෙන වසර අනුව ගණන් බැලිය යුතු ය.

6. තොරතුරු තාක්ෂණයට සම්බන්ධ පුහුණුව, වෘත්තීය පුහුණුව සහ කළමනාකරණය, නිපුණතා වර්ධනය, විදේශ රැකියා පිළිබඳ සහ ඉංග්‍රීසි පුහුණුව, ගණකාධිකරණය, නීතිය සහ වෙළඳ ක්‍රියාවලි සැපයීමේ කර්මාන්ත පිළිබඳ අනුමත පාඨමාලා, ව්‍යාපාර සඳහා වන ඉංග්‍රීසි ආදී අධ්‍යාපන ක්ෂේත්‍රයේ ව්‍යාපාරයක් සඳහා 2006 අප්‍රේල් 1 වන දින සිට දෙවසරක (02) කාලසීමාවක් තුළ ප්‍රසාරණ ඒකක එකක් හෝ වැඩි ගණනක් පිහිටුවන සහ පහත දැක්වෙන 1 වන තීරුවේ අනුරූපිත සටහන්වල සවිස්තරිත පුද්ගලයන් ගණනක් පුහුණු කළ යුතු වන රුපියල් මිලියන පහළොවක (රු. 15,000,000) අවම ආයෝජනයක් සහිත නව ව්‍යවසායක ලාභ සහ ආදායම කෙරෙහි ආදායම් බදු පැනවීම, ගෙවීම සහ අයකිරීම පිළිබඳ දේශීය ආදායම් පනතේ විධිවිධාන ආදාළ නොවිය යුතු ය.

| *1 තීරුව වසරකට පුහුණු කළ යුතු පුද්ගලයන් ගණන* | *11 තීරුව සහනය පවතින කාලසීමාව* |
|---|---|
| 500 | වසර 03 |
| 1,000 | වසර 05 |
| 1,500 | වසර 08 |

එකී සහනය පවතින කාලසීමාව ඒ ව්‍යවසාය ලාභ ලැබීම අරඹන වසරේ සිට හෝ වෙළඳ මෙහෙයුම් අරඹන දින සිට වසර දෙකක් (02) තුල යම් තක්සේරු වසරක් යන දෙකින් වඩා කලින් යෙදෙන වසර අනුව ගිණිය යුතු ය. පවතින ව්‍යවසායක් පිළිබඳ එකී සහන කාලසීමාව මණ්ඩලය විසින් නිශ්චිතව දක්වනු ලබන තක්සේරු වසරක සිට ගණන් බැලිය යුතු ය.

7. 2006 අප්‍රේල් 1 වන දින සිට අවුරුදු දෙකක කාලසීමාවක් තුළ රුපියල් මිලියන පහළොවක (රුස 15,000,000) අවම ආයෝජනයක් සහිත රෙදිපිළි සහ ඇඳුම් කර්මාන්තය, හෙදි පුහුණුව, ආහාර සැකසීම, කෘෂි කර්මාන්තය, වැවිලි කර්මාන්තය පිළිබඳ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා පිහිටුවන සහ පහත 1 වන තීරුවේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් පුද්ගලයන් ගනන පුහුණු කළ යුතු බව වන නව ව්‍යවසායක් හෝ ප්‍රසාරන ඒකකයක් හෝ ඒකක සහිතව පවතින ව්‍යවසායක ලාභ හෝ ආදායම කෙරෙහි මෙහි පහත 1 වන තීරුවේ අනුරූප සටහන් සඳහන් කාලසීමාව සඳහා ආදායම් බදු පැනවීම, ගෙවීම හා අය කිරීම පිළිබඳ දේශීය ආදායම් පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

| *1 තීරුව*<br>*වසරකට පුහුණු කළ යුතු පුද්ගලයන් ගණන* | *11 තීරුව*<br>*සහනය පවතින කාලසීමාව* |
|---|---|
| 100 | වසර 03 |
| 300 | වසර 05 |
| 500 | වසර 08 |

එකී සහන කාලසීමාව ඒ ව්‍යවසාය ලාභ ලැබීම අරඹන වසරේ සිට හෝ වෙළඳ මෙහෙයුම අරඹන දින සිට වසර දෙකක (02) කාලසීමාව තුල යම් තක්සේරු වසරක් යන දෙකින් වඩා කලින් යෙදෙන වසර සිට ගණන් බැලිය යුතුය.

8. පහත දැක්වෙන I වන තීරුවේ අනුරූප සටහන්වල නිශ්චිතව සඳහන් අවම අයෝජනයක් සහිතව සහ මෙහි පහත II වන තීරුවේ නිශ්චිතව සඳහන් දේශීය පුද්ගලයන් සංඛ්‍යාවක් සේවයේ නියුක්ත කරමින් 2006 අප්‍රේල් 1 වන දින සිට අවුරුදු 2 ක කාලසීමාවක් තුළ සෑදීමේ හෝ සේවා සැපයීමේ ඒකක පිහිටුවීම මගින් භාණ්ඩ හෝ සේවා ග්‍රාමීය අංශයට සෘජුව හෝ චක්‍රාකාරයෙන් පිට කරනු ලබන නව හෝ පවතින ව්‍යවසායක ලාභ හෝ අදායම කෙරෙහි මෙහි පහත III වන තීරුවේ නිශ්චිතව සඳහන් කාලසීමාව සඳහා ආදායම් බදු පැනවීම, ගෙවීම හා අයකිරීම සම්බන්ධයෙන් වූ දේශීය ආදායම් පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

| *I තීරුව*<br>*අයෝජන* | *II තීරුව*<br>*සේවකයන් ගණන* | *III තීරුව*<br>*සහන කාලසීමාව* |
|---|---|---|
| රුපියල් මිලියන 15 | 100 | වසර 03 |
| රුපියල් මිලියන 20 | 200 | වසර 05 |
| රුපියල් මිලියන 30 | 300 | වසර 08 |

එකී සහන කාලසීමාව නව ව්‍යවසායක් සම්බන්ධයෙන් වන විට ඒ ව්‍යවසාය ලාභ ලැබීම අරඹන වසරේ සිට හෝ වෙළෙඳ මෙහෙයුම අරඹන දින සිට වසර දෙකක (02) කාලසීමාව තුළ යම් තක්සේරු වසරක් යන දෙකින් කලින් එළඹෙන වසර සිට ගණන් බැලිය යුතු ය. පවතින ව්‍යවසායයක් පිළිබඳ එකී සහන කාලසීමාව මණ්ඩලය විසින් නිශ්චිතව දක්වනු ලබන තක්සේරු වසරක සිට ගණන බැලිය යුතු ය.

9. කොළඹ හෝ ගම්පහ දිස්ත්‍රික්කයේ කම්හල/කම්හල් පිහිටි සහ 2006 අප්‍රේල් 1 වන දින සිට වසර දෙකක (02) කාලසීමාවක් තුළ දේශීය පුද්ගලයන් දෙසීයක (200) අවම සේවක සංඛ්‍යාවක් පවත්වා ගනිමින් ඒ කම්හල/කම්හල් දුෂ්කර නොවන ප්‍රදේශයක යළි පිහිටුවන පවතින ව්‍යවසායක ලාභ සහ ආදායම කෙරෙහි වසර 05 ක කාලසීමාවක් සඳහා ආදායම් බදු පැනවීම, ගෙවීම හා අයකර ගැනීම පිළිබඳව දේශීය ආදායම් පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

එබඳු ව්‍යවසායක දේශීය පුද්ගලයන් දෙසීයක (200) අවම සංඛ්‍යාවක් යොදවන අතර එය විසින් යළි පිහිටවූ කම්හල/කම්හල් වන සේවයේ නොයෙදුණු සේවකයන්ට එම කාලයෙහි පවතින කම්කරු නියෝග වලට අනුව හිමි සියළු සමාප්ති ප්‍රතිලාභ බේරුම් කළ යුතු ය.

එකී සහන කාලසීමාව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ තක්සේරු වර්ෂයක සිට ගණන් බැලිය යුතු ය.

## ආ කොටස

මණ්ඩලය විසින් දුෂ්කර ප්‍රදේශයක් ලෙස නම් කරනු ලැබූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක (කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික් හැර) ව්‍යාපාරයක් පිහිටුවන ව්‍යවසායකට පහත දැක්වෙන 1-9 දක්වා වූ අයිතම අදාළ වේ.

1. භාණ්ඩ (නිමි ඇඳුම් හැර) නිපදවීමට හෝ සෑදීමට හෝ සේවා සැපයුමට ව්‍යාපාරයක් පිහිටුවන රුපියල් මිලියන තිහක (රු. 30,000,000) අවම අයෝජනයක් සහිත 2006 අප්‍රේල් 1 වන දින සිට වසර දෙකක (02) කාලසීමාවක් තුළ පහත දැක්වෙන I වන තීරුවේ අනුරූප සටහන්වල

නිශ්චිතව සඳහන් පුද්ගලයන් ගණනක් සේවයේ යොදවන නව ව්‍යාවසායක ලාභ සහ ආදායම කෙරෙහි පහත දැක්වෙන II වන තීරුවේ නිශ්චිතව සඳහන් කාලසීමාව සඳහා දේශීය ආදායම් පනතේ ආදායම් බදු පැනවීම, ගෙවීම සහ අයකිරීම පිළිබඳ විධිවිධාන නො යෙදේ.

| *I වන තීරුව*<br>*සේවකයන් ගණන* | *II වන තීරුව*<br>*සහන කාලසීමාව* |
|---|---|
| 200 සහ ඊට වැඩි | වසර 08 |
| 100 - 199 | වසර 05 |
| 50 - 99 | වසර 03 |

එකී සහන කාලසීමාව එම ව්‍යාවසාය ලාභ ලැබීම අරඹන වසර හෝ වෙළඳ මෙහෙයුම් අරඹන දින සිට වසර දෙකක් (02) නො ඉක්මවන කාලයක් තුළ යම් තක්සේරු වසරකින් යන දෙකින් කලින් එළඹෙන කවර හෝ වර්ෂයක සිට ගණන් බැලිය යුතු ය.

2. රුපියල් මිලියන තිහකට (රු. 30,000,000) නොඅඩු අයෝජනයක් සහිතව 2006 අප්‍රේල් 1 වන දින සිට අවුරුදු දෙකක කාලයක් තුළ භාණ්ඩ (ඇඟලුම් හැර) නිපදවීම හෝ සෑදීම හෝ දේශීය වෙළඳ පොලට සේවා සැපයීම හෝ සඳහා යම් ගිලන් කර්මාන්තයක් ඒ ගිලන් කර්මාන්තයේ වත්කම් හා සේවකයන් සමඟ පවරා ගනු ලබන සහ එකී ගිලන් කර්මාන්තයේ දැනට සිටින සේවකයින් දිගටම සේවයේ නියුක්ත කරනු ලබන්නේ නම් ඒ සංඛ්‍යාව හෝ දෙසීයකට නොඅඩු (200) දේශීය පුද්ගලයන් හෝ යන දෙකින් වඩා වැඩි සංඛ්‍යාවක සේවකයින් සේවයේ නියුක්ත කරනු ලබන්නා වූද යම් නව ව්‍යාවසායක ලාභ හෝ ආදායම කෙරෙහි වසර පහක (05) කාලසීමාවක් සඳහා ආදායම් බදු පැනවීම, ගෙවීම හා අයකිරීම සම්බන්ධයෙන් වූ දේශීය ආදායම් පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

එකී සහන කාලසීමාව එම ව්‍යාවසාය ලාභ ලැබීම අරඹන වසර හෝ වාණිජ මෙහෙයුම් අරඹන දින සිට වසර දෙක (02) නො ඉක්මවන කාලයක් තුළ යම් තක්සේරු වර්ෂයක හෝ යන දෙකින් කලින් එළඹෙන කවර හෝ වර්ෂයක සිට ගණන් බැලිය යුතු ය.

3. ඇඳුම් නිෂ්පාදනය කිරීම සඳහා පහත දැක්වෙන I වන තීරුවේ අනුරූපිත සටහන්වල සවිස්තරිත දේශීය පුද්ගලයන් ගණන සේවයේ යොදවන 2006 අප්‍රේල් 1 වන දින සිට වසර දෙකක (02) කාලසීමාවක් තුළ රුපියල් මිලියන තිහකට (රු. 30,000,000) නො අඩු අයෝජනයක් සහිත වූද එකී නිෂ්පාදිතයෙන් සියයට අසූවකට (80%) නො අඩු ප්‍රමාණයක් අපනයන කරන්නා වූ ද නව ව්‍යාවසායක ලාභ හෝ ආදායම කෙරෙහි පහත දැක්වෙන II වන තීරුවේ අනුරූපිත සටහන්වල නිශ්චිතව සඳහන් කාලසීමාව තුළ ආදායම් බදු පැනවීම, ගෙවීම සහ අයකිරීම පිළිබඳ දේශීය ආදායම් පනතේ විධිවිධාන බලනොපාන්නේ ය.

| *I තීරුව*<br>*සේවකයන් ගණන* | *II තීරුව*<br>*සහන කාලසීමාව* |
|---|---|
| 200 - 999 | වසර 08 |
| 1000 සහ ඊට වැඩි | වසර 10 |

එකී සහන කාලසීමාව එම ව්‍යාවසාය ලාභ ලැබීම අරඹන වසරේ සිට හෝ වෙළඳ මෙහෙයුම අරඹන දින සිට වසර දෙක (02) නො ඉක්මවන කාලසීමාවක් තුළ යම් තක්සේරු වසරක් යන දෙකින් කලින් එළඹෙන කවර හෝ වසරක සිට ගණන් බැලිය යුතු ය.

4. රුපියල් මිලියන තිහකට (රු. 30,000,000) නොඅඩු ආයෝජනයක් සහිතව සහ මෙහි පහත I වන තීරුවේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් ප්‍රමාණයක දේශීය පුද්ගලයන් සංඛ්‍යාවක් සේවයේ නියුක්ත කරමින් 2006 අප්‍රේල් 1 වන දින සිට අවුරුදු දෙකක කාලයක් තුළ භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ සෑදීම හෝ සේවා සැපයීම සඳහා යම් ගිලන් කර්මාන්තයක් ඒ ගිලන් කර්මාන්තයේ වත්කම් හා සේවකයන් ද සමග පවරා ගනු ලබන සහ භාණ්ඩ සෑදීමේ දී එහි නිෂ්පාදන වලින් සියයට අසූවකට (80%) නො අඩු ප්‍රමාණයක් ද, සේවා සැපයීමේ දී සියයට හැත්තෑවකට (70%) නොඅඩු ප්‍රමාණයක් ද අපනයනය කරනු ලබන නව ව්‍යාවසායක ලාභ සහ ආදායම කෙරෙහි පහත II වන තීරුවේ අනුරූප සටහන්වල නිශ්චිතව ඇති කාලසීමාව සඳහා ආදායම් බදු පැනවීම, ගෙවීම හා අයකිරීම සම්බන්ධයෙන් වූ දේශීය ආදායම් පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

| *I තීරුව*<br>*සේවකයන් ගණන* | *II තීරුව*<br>*සහන කාලසීමාව* |
|---|---|
| 200 - 999 | වසර 08 |
| 1000 සහ ඊට වැඩි | වසර 10 |

එකී සහන කාලසීමාව එම ව්‍යාවසාය ලාභ ලැබීම අරඹන වසරේ සිට හෝ වෙළඳ මෙහෙයුම අරඹන දින සිට වසර දෙක (02) නො ඉක්මවන කාලසීමාව තුළ යම් තක්සේරු වසරක් යන දෙකින් කලින් යෙදෙන කවර හෝ වසරක සිට ගිණිය යුතු ය.

5. 2006 අප්‍රේල් 1 වන දින සිට අවුරුදු දෙකක (02) කාලසීමාවක් තුළ දේශීය පුද්ගලයන් විස්සකට (20) නොඅඩු ගණනක් සේවයේ යොදවන රුපියල් මිලියන පහළොවක (රු. 15,000,000) අවම අයෝජනයක් සහිතව කෘෂි ව්‍යාපාරයක් අරඹන නව ව්‍යවසායක ලාභ සහ අදායම කෙරෙහි වසර අටක (08) කාලසීමාවකට ලාභ සහ අදායම සම්බන්ධයෙන් ආදායම් බදු පැනවීම, ගෙවීම සහ අයකිරීමට අදාළ දේශීය අදායම් පනතේ විධිවිධාන බල නොපාන්නේය.

එකී සහන කාලසීමාව එම ව්‍යවසාය ලාභ ලැබීම අරඹන වසරේ හෝ වෙළඳ මෙහෙයුම අරඹන දින සිට වසර දෙකක (02) කාලසීමාවක් සඳහා යම් තක්සේරු වසරක් හෝ යන දෙකින් කලින් එළඹෙන කවර හෝ වසරක සිට ගණන් බැලිය යුතු ය.

6. තොරතුරු තාක්ෂණයට සම්බන්ධ පුහුණුව, වෘත්තීය පුහුණුව සහ කළමනාකරණය නිපුණතා වර්ධනය, විදේශ රැකියා සඳහා සහ ඉංග්‍රීසි පුහුණුව, ගණකාධිකරණය. නීතිය සහ වෙළඳ ක්‍රියාවලි සැපයීමේ කර්මාන්තය පිළිබඳ අනුමත පාඨමාලා, ව්‍යාපාරික ඉංග්‍රීසි ආදී අධ්‍යාපන ක්ෂේත්‍රයට අයත් ව්‍යාපාරයක් පැවැත්වීම පිණිස වන නව ව්‍යවසායක් හෝ ප්‍රසාරණ ඒකකයක් හෝ ඒකක සහිත පවතින ව්‍යවසායක් පිණිස 2006 අප්‍රේල් 1 වැනි දින සිට දෙවසරක (02) කාලසීමාවක් තුළ පහත දැක්වෙන I වන තීරුවේ අනුරූපිත සටහන්වල සවස්තරික පුද්ගලයන් ගණන වසරකට පුහුණු කළ යුතු වන, රුපියල් මිලියන පහළොවක (රු. 15,000,000) අවම ආයෝජනයක් සහිත වූ ව්‍යාපාරයක ලාභ සහ ආදායම කෙරෙහි පහත II වන තීරුවේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් කාලසීමාව සඳහා ආදායම් බදු පැනවීම, ගෙවීම හා අයකිරීම සම්බන්ධයෙන් වූ දේශීය ආදායම් පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

| *I තීරුව*<br>*වසරකට පුහුණු කළයුතු පුද්ගලයන් ගණන* | *II තීරුව*<br>*සහන කාලසීමාව* |
|---|---|
| 500 | වසර 05 |
| 800 | වසර 08 |
| 1000 | වසර 10 |

එකී සහන කාලසීමාව නව ව්‍යවසායක් සම්බන්ධයෙන් වනවිට ඒ ව්‍යවසාය ලාභ ලැබීම අරඹන වසරේ සිට හෝ වෙළඳ මෙහෙයුම අරඹන දින සිට වසර දෙකක් (02) තුළ යම් තක්සේරු වසරක් සඳහා වඩා කලින් යෙදෙන වසර අනුව නව ව්‍යවසාය පිළිබඳ ගිණිය යුතු ය. පවතින ව්‍යවසායක් පිළිබඳව නම් එකී සහන කාලසීමාව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන තක්සේරු වසරේ සිට ගිණිය යුතු ය.

7. 2006 අප්‍රේල් 1 වැනි දින සිට අවුරුදු දෙකක (02) කාලසීමාවක් තුළ රුපියල් මිලියන 15 (15,000,000) අවම ආයෝජනයක් සහිතව සහ මෙහි පහත I වන තීරුවේ නිශ්චිතව සඳහන් පුද්ගලයන් සංඛ්‍යාවක් බැගින් වසරක් පාසා පුහුණු කළ යුතු වූ රෙදිපිළි සහ ඇඳුම් කර්මාන්තය, හෙදි පුහුණුව, ආහාර සැකසීම් පුහුණුව, ගොවිතැන සහ වැවිලි කර්මාන්තය යන ක්ෂේත්‍රවල අධ්‍යාපනය ලබාදීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා වූ නව ව්‍යවසායක් හෝ ප්‍රසාරණ ඒකකයක් හෝ ඒකක පිහිටුවන පවතින ව්‍යවසායක ලාභ සහ ආදායම කෙරෙහි මෙහි පහත II වැනි තීරුවේ නිශ්චිතව සඳහන් කාලසීමාව සඳහා ආදායම් බදු පැනවීම, ගෙවීම හා අයකිරීම සම්බන්ධයෙන් වූ දේශීය ආදායම් පනතේ විධිවිධාන අදාළ නොවිය යුතුය.

| *I තීරුව*<br>*වසරකට පුහුණු කළයුතු පුද්ගලයන් ගණන* | *II තීරුව*<br>*සහන කාලසීමාව* |
|---|---|
| 100 | වසර 05 |
| 250 | වසර 08 |
| 350 | වසර 10 |

එකී සහන කාලසීමාව ඒ ව්‍යවසාය ලාභ ලැබීම අරඹන වසරේ සිට හෝ වෙළඳ මෙහෙයුම අරඹන දින සිට වසර දෙකක් තුළ යම් තක්සේරු වසරක් යන දෙකින් වඩා කලින් යෙදෙන වසර සිට ගිණිය යුතුය.

8. පහත දැක්වෙන I වන තීරුවේ අනුරූප සටහන්වල නිශ්චිතව සඳහන් අවම ආයෝජනයක් සහිතව මෙහි පහත II තීරුවේ නිශ්චිතව සඳහන් දේශීය පුද්ගලයන් සංඛ්‍යාවක් සේවයේ නියුක්ත කරමින් 2006 අප්‍රේල් 1 වැනි දින සිට අවුරුදු 2 ක කාලසීමාවක් තුළ නිෂ්පාදන හෝ සේවා ග්‍රාමීය අංශයට සෘජුව හෝ වක්‍රව පිට කරනු ලබන නව හෝ පවතින ව්‍යවසායක ලාභ හෝ ආදායම කෙරෙහි මෙහි පහත III වැනි තීරුවේ නිශ්චිතව සඳහන් කාලසීමාව සඳහා ආදායම් බදු පැනවීම, ගෙවීම හා අයකිරීම සම්බන්ධයෙන් වූ දේශීය ආදායම් පනතේ විධිවිධන අදාළ නොවිය යුතුය.

| *I තීරුව* *ආයෝජනය* | *II තීරුව* *සේවකයන් ගණන* | *III තීරුව* *සහන කාලසීමාව* |
|---|---|---|
| රුපියල් මිලියන 10 | 75 | වසර 05 |
| රුපියල් මිලියන 15 | 100 | වසර 08 |
| රුපියල් මිලියන 20 | 225 | වසර 10 |

එකී සහන කාලසීමාව නව ව්‍යවසායයක් සම්බන්ධයෙන් වනවිට ඒ ලාභ ලැබීම අරඹන වසරේ සිට හෝ වෙළඳ මෙහෙයුම අරඹන දින සිට වසර දෙකක් (02) තුළ යම් තක්සේරු වසරක් යන දෙකින් වඩා කලින් යෙදෙන වසර අනුව ගිණිය යුතු ය. පවතින ව්‍යවසායක් පිළිබඳව නම් එකී සහන කාලසීමාව මණ්ඩලය විසින් සවිස්තරික තක්සේරු වසරක් අනුව ගිණිය යුතු ය.

9. කොළඹ දිස්ත්‍රික්කයේ හෝ ගම්පහ දිස්ත්‍රික්කයේ ස්වකීය කර්මාන්ත ශාලාව හෝ ශාලා පිහිටි සහ 2006 අප්‍රේල් 1 වැනි දින සිට වර්ෂ 2 ක කාලයක් තුළ දේශීය පුද්ගලයන් 200 අවම සේවක සංඛ්‍යාවක් පවත්වා ගනිමින් ඒ කම්හල/කම්හල් දුෂ්කර ප්‍රදේශයක යළි පිහිටුවන පවතින ව්‍යවසායක ලාභ හා ආදායම කෙරෙහි අවුරුදු 8 ක කාලයක් සඳහා ආදායම් බදු පැනවීම, ගෙවීම සහ අය කිරීමට අදාළ දේශීය ආදායම් පනතේ විධිවිධාන අදාළ නොවිය යුතුය.

එබඳු ව්‍යවසායක් අවම වශයෙන් දේශීය පුද්ගලයන් දෙසීයක් (200) එහි සේවයේ යොදවන අතර එහි යළි පිහිටවූ කම්හල/කම්හල්වල සේවයේ නියුක්ත කොකරන ලද සේවකයන්ට එම කාලයෙහි පවතින කම්කරු රෙගුලාසිවලට අනුව හිමි සියලු සමාජ්ති ප්‍රතිලාභ බේරුම් කළ යුතුය.

එකී සහන කාලසීමාව මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන තක්සේරු වසරක් අනුව ගිණිය යුතුය.

ඇ කොටස

මණ්ඩලය විසින් බෙහෙවින් දුෂ්කර පෙදෙසක් ලෙස නම් කළ (කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල නොවන) යම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාශයක ව්‍යාපාරයක් පිහිටුවන ව්‍යවසායකට පමණක් මේ නියෝගවල 1 සිට 9 දක්වා වන අයිතම අදාළ වේ.

1. භාණ්ඩ (ඇහලුම් හැර) නිපදවීමට හෝ සෑදීමට හෝ සේවා සැපයුමට ව්‍යාපාරයක් අරඹන, රුපියල් මිලියන තිහක ((300,00,000) අවම ආයෝජනයක් සහිත පහත දැක්වෙන 1 වැනි තීරුවේ අනුරූපිත සටහන්වල නිශ්චිතව සඳහන් දේශීය පුද්ගලයන් ගණනක් 2006 අප්‍රේල් 01 දින සිට දැවුරුදු (2) කාලසීමාවක් තුල සේවයේ යොදවන නව ව්‍යවසායක ලාභ සහ ආදායම කෙරෙහි පහත 11 වැනි තීරුවේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් කාලයක් සඳහා ආදායම බද්ද පැනවීම, ගෙවීම සහ අයකිරීම පිළිබඳ දේශීය ආදායම් පනතේ විධිවිධාන නොයෙදේ.

| *I තීරුව* සේවකයන් ගණන | *II තීරුව* සහන කාලසීමාව |
|---|---|
| 200 සහ ඊට වැඩි | වසර 10 |
| 100-199 | වසර 08 |
| 50-99 | වසර 05 |

එකී සහන කාලසීමාව එම ව්‍යවසාය ලාභ ලැබීම අරඹන වසරේ සිට හෝ වෙළඳ මෙයෙයුම් අරඹන දින සිට වසර දෙකක් තුළ යම් තක්සේරු වසරක් යන දෙකින් වඩා කලින් එළඹෙන වසර සිට ගණන් බැලිය යුතුය.

2. රුපියල් මිලියන තිහකට (රු. 30,000,000) නොඅඩු ආයෝජනයක් සහිතව, 2006 අප්‍රේල් 1 වැනි දින සිට අවුරුදු 2 ක කාලයක් තුළ ඇහලුම් හැර) භාණ්ඩ නිෂ්පාදනය හෝ සෑදීම හෝ දේශීය වෙළඳ පොළට සේවා සැපයීම පිණිස යම් ගිලන් කර්මාන්තයක් ඒ කර්මාන්තයේ වත්කම් හා සේවකයන්ද සමග පවරාගනු ලබන සහ එකී ගිලන් කර්මාන්තයේ දැනට සිටින සේවකයන් ගණන හෝ දෙසීයකට (200) නොඅඩු දේශිය පුද්ගලයන් හෝ යන දෙකින් වඩා වැඩි ප්‍රමාණයක සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවනු ලබන නව ව්‍යවසායක ලාභ සහ ආදායම් කෙරෙහි අවුරුදු අටක (08) කාලයක් සඳහා ආදායම් බදු පැනවීම, ගෙවීම හා අයකිරීමටඅදාළ දේශීය ආදායම් පනතේ විධිවිධාන අදාළ නොවිය යුතුය.

එකී සහන කාලසීමාව එම ව්‍යවසාය ලාභ ලැබීම අරඹන වසරේ සිට හෝ වෙළඳ මෙහෙයුම අරඹන දින සිට වසර දෙක නොඉක්මවන කලින් යෙදෙන කොයි එක හෝ යම් තක්සේරු වසරක් අනුව ගිණිය යුතුය.

3. රුපියල් මිලියන තිහකට (රු. 30,000,000) නොඅඩු ආයෝජනයක් සහිතව සහ දෙසීයකට (200) හෝ ඊට වැඩි සංඛ්‍යාවක දේශීය පුද්ගලයන් සංඛ්‍යාවක් සේවයේ නියුක්ත කරමින් 2006 අප්‍රේල් 1 වැනි දින සිට අවුරුදු 2 ක කාලයක් තුළ ඇඳුම් නිෂ්පාදනය කිරීම සඳහා ව්‍යාපාරයක් පිහිටුවන සහ එහි නිෂ්පාදිතයෙන් සියයට අසූවකට (80%) නොඅඩු ප්‍රමාණයක් ආනයනය කරනු ලබන නව ව්‍යවසායක ලාභ සහ ආදායම කෙරෙහි අවුරුදු දහයක (10) කාලසීමාවක් සඳහා ආදායම් බදු පැනවීම, ගෙවීම හා අයකිරීම පිළිබඳ දේශීය ආදායම් පනතේ විධිවිධාන අදාළ නොවිය යුතුය.

එකී සහන කාලසීමාව ව්‍යවසාය ලාභ ලැබීම අරඹන වසරේ සිට හෝ වෙළඳ මෙහෙයුම් අරඹන දින සිට වසර දෙකක කාලසීමාවක් තුළ යම් තක්සේරු වසරක් යන දෙකින් වඩා කලින් යෙදෙන වසර සිට ගණන් බැලිය යුතුය.

4. රුපියල් මිලියන තිහකට (රු. 30,000,000) නොඅඩු ආයෝජනයක් සහිතව සහ දේශීය පුද්ගලයන් දෙසීයක් (200) හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ නියුක්ත කරමින් 2006 අප්‍රේල් 1 වැනි දින සිට අවුරුදු දෙකක (02) කාලයක් තුළ භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ සෑදීම හෝ සේවා සැපයීම සඳහා යම් ගිලන් කර්මාන්තයක් ඒ ගිලන් කර්මාන්තයේ වත්කම් හා සේවකයන්ද සමග පවරා ගන්නා සහ භාණ්ඩ සෑදීමේදී එහි නිෂ්පාදනවලින් සියයට අසූවකට (80) නොඅඩු ප්‍රමාණයක්ද සේවා සැපයීමේදී සියයට හැත්තෑවකට (70%) නොඅඩු ප්‍රමාණයක් ද අපනයනය කරනු ලබන නව ව්‍යවසායක ලාභ සහ ආදායම කෙරෙහි අවුරුදු 10 ක කාලයක් සඳහා ආදායම් බදු පැනවීම, ගෙවීම හා අයකිරීම පිළිබඳ දේශීය ආදායම් පනතේ විධිවිධාන අදාළ නොවිය යුතුය.

එකී සහන කාලසීමාව එම ව්‍යවසාය ලාභ ලැබීම අරඹන වසරේ සිට හෝ වෙළඳ මෙහෙයුම අරඹන දින සිට වසර දෙකක (02) කාලසීමාවක් තුළ යම් තක්සේරු වසරක් යන දෙකින් වඩා කලින් යෙදෙන වසර සිට ගණන් බැලිය යුතුය.

5. 2006 අප්‍රේල් 01 වැනි දින සිට දෑවුරුදු (02) කාලසීමාවක් තුළ දේශීය පුද්ගලයන් විස්සකට (20) නොඅඩු ගණනක් සේවයෙහි යොදවමින් රුපියල් මිලියන පහළොවක (රු. 1,50,00,000) අවම ආයෝජනයක් සහිතව කෘෂි ව්‍යාපාරයක් අරඹන නව ව්‍යවසායක ලාභ සහ ආදායම කෙරෙහි වසර දහයක (10) කාලසීමාවකට බදු පැනවීම, ගෙවීම සහ අයකිරීම පිළිබඳ දේශීය ආදායම් පනතේ විධිවිධාන අදාළ නොවිය යුතුය.

එකී සහන කාලසීමාව එම ව්‍යවසාය ලාභ ලැබීම අරඹන වසරේ සිට හෝ වෙළඳ මෙහෙයුම් අරඹන දින සිට වසර දෙකක (02) කාලසීමාවක් තුළ යම් තක්සේරු වසරක් යන දෙකින් වඩා කලින් යෙදෙන වසර සිට ගණන් බැලිය යුතුය.

6. තොරතුරු තාක්ෂණයට සම්බන්ධ පුහුණුව, වෘත්තීය පුහුණුව සහ කළමනාකරණය, නිපුනතා වර්ධනය, දේශීය රැකියා සඳහා පුහුණුව, ඉංග්‍රීසි පුහුණුව, ගණකාධිකරණය, නීතිය හා වෙළඳ ක්‍රියාවලි සැපයීමේ කර්මාන්තය පිළිබඳ අනුමත පාඨමාලා, ව්‍යාපාරික ඉංග්‍රීසි ආදී අධ්‍යාපන ක්ෂේත්‍රයට අයත් ව්‍යාපාරයක් පැවැත්වීමට 2006 අප්‍රේල් 01 වැනි දින සිට වසර දෙකක (02) කාලයක් තුළ රුපියල් මිලියන පහළොවක (රු. 15,000,000) අවම ආයෝජනයක් සහිතව පිහිටුවන සහ මෙහි I වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් ප්‍රමාණයක පුද්ගලයන් සංඛ්‍යාවක් වර්ෂයක කාලයක් තුළ පුහුණු කළ යුතු නව ව්‍යවසායක හෝ ප්‍රසාරණ ඒකකයක් හෝ ඒකක පිහිටුවන පවතින ව්‍යවසායක ලාභ හෝ ආදායම කෙරෙහි මෙහි පහත II වන තීරුවේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් කාලසීමාව සඳහා ආදායම් බදු පැනවීම, ගෙවීම හා අයකිරීම පිළිබඳ දේශීය ආදායම් පනතේ විධිවිධාන අදාළ නොවිය යුතුය.

| *I තීරුව*<br>*වසරකට පුහුණු කළ යුතු පුද්ගලයන් ගණන* | *II තීරුව*<br>*සහන කාලසීමාව* |
|---|---|
| 300 | වසර 05 |
| 500 | වසර 08 |
| 750 | වසර 10 |

එකී සහන කාලසීමාව නව ව්‍යවසායක් සම්බන්ධයෙන් වන විට ඒ ව්‍යවසාය ලාභ ලැබීම අරඹන වසරේ සිට හෝ වෙළෙඳ මෙහෙයුම අරඹන දින සිට වසර දෙකක් (02) තුළ යම් තක්සේරු වසර යන දෙකින් වඩාත් කලින් යෙදෙන වසර සිට ගණන් බැලිය යුතුය. පවතින ව්‍යවසායක් පිළිබඳ වන විට එකී සහන කලාසීමාව මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන තක්සේරු වර්ෂයක සිට ගණන් බැලිය යුතුය.

7. රුපියල් මිලියන පහළොවකට (රු. 15,0,00,000) නොඅඩු ආයෝජනයක් සහිතව සහ මෙහි පහත පළවන තීරුවේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් පුද්ගලයන් සංඛ්‍යාවක් අවුරුදු පතා පුහුණු කරමින් 2006 අප්‍රේල් 01 වන දින සිට අවුරුදු දෙකක (02) කාලයක තුළ රෙදිපිළි සහ ඇඳුම් කර්මාන්තය හෙදි පුහුණුව, ආහාර සැකසීමේ කර්මාන්ත ශාලා පුහුණුව, කෘෂි කර්මාන්තය සහ වැවිලි කර්මාන්තය යන ක්ෂේත්‍රයන්හි අධ්‍යයන කටයුතු සඳහා ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන නව ව්‍යවසායක හෝ ප්‍රසාරණ ඒකකයක් හෝ ඒකක පිහිටුවන පවතින ව්‍යවසායක ලාභ හා ආදායම කෙරෙහි මෙහි පහත II වන තරුවේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාව සඳහා ආදායම් බදු පැනවීම, ගෙවීම හා අයකිරීමට අදාළ දේශීය ආදායම් පනතේ විධිවිධාන අදාළ නොවිය යුතුය.

| *I තීරුව*<br>*වසරකට පුහුණු කළ යුතු පුද්ගලයන් ගණන* | *II තීරුව*<br>*සහන කාලසීමාව* |
|---|---|
| 75 | වසර 05 |
| 150 | වසර 08 |
| 250 | වසර 10 |

එකී සහන කාලසීමාව එම ව්‍යාවසාය ලාභ ලැබීම අරඹන වසරේ සිට හෝ වෙළඳ මෙහෙයුම් අරඹන දින සිට වසර දෙකක් (02) තුළ යම් තක්සේරු වසරක් යන දෙකින් වඩාත් කලින් යෙදෙන වසර සිට ගණන් බැලිය යුතුය.

8. පහත සඳහන් I වන තීරුවේ අනුරූප සටහන්වල නිශ්චිතව දැක්වෙන අවම ආයෝජනයක් සහිතව සහ මෙහි පහත II වන තීරුවේ නිශ්චිතව සඳහන් දේශීය පුද්ගලයන් සංඛ්‍යාවක් සේවයේ නියුක්ත කරවමින් 2006 අප්‍රේල් 01 වැනි දින සිට අවුරුදු දෙකක (02) කාලසීමාවක් තුළ අවස්ථාවෝචිත පරිදි සැදීමේ හෝ සේවා සැපයීමේ ඒකක මගින් නිෂ්පාදිත හෝ සේවා ග්‍රාමීය අංශයට සෘජුව හෝ චක්‍රකාරයෙන් පිට කරනු ලබන පවතින හෝ නව ව්‍යාවසායයක ලාභ හෝ ආදායම කෙරෙහි මෙහි පහත III වන තීරුවේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් කාලසීමා සඳහා බදු පැනවීම, ගෙවීම හා අයකිරීම පිළිබඳ දේශීය ආදායම් පනතේ විධිවිධාන අදාල නොවිය යුතුය.

| *I තීරුව* *ආයෝජනය* | *II තීරුව* *සේවකයන් ගණන* | *III වන තීරුව* *සහන කාලසීමාව* |
|---|---|---|
| රුපියල් මිලියන 10 | 50 | වසර 05 |
| රුපියල් මිලියන 12 | 100 | වසර 08 |
| රුපියල් මිලියන 15 | 200 | වසර 10 |

එකී සහන කාලසීමාව නව ව්‍යාවසායක් වන විට, ඒ ව්‍යාවසාය ලාභ ලැබීම අරඹන වසරේ සිට හෝ වෙළෙඳ මෙහෙයුම අරඹන දින සිට වසර දෙකක් (02) තුළ යම් තක්සේරු වසරක් යන දෙකින් වඩාත් කලින් යෙදෙන වසර සිට ගණන් බැලිය යුතුය. පවතින ව්‍යාවසාය පිළිබඳ එකී සහන කාලසීමාව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන තක්සේරු වසරක සිට ගණන් බැලිය යුතුය.

9. කොළඹ දිස්ත්‍රික්කයේ හෝ ගම්පහ දිස්ත්‍රික්කයේ ස්වකීය කර්මාන්ත ශාලාව හෝ කර්මාන්ත ශාලා පිහිටි සහ 2006 අප්‍රේල් 01 වන දින සිට අවුරුදු දෙකක (02) කාලයක් තුළ අවම වශයෙන් දේශීය පුද්ගලයන් දෙසීය දෙනෙකු (200) සේවයේ නියුක්ත කරමින් ඒ කම්හල හෝ කම්හල් බෙහෙවින් දුෂ්කර ප්‍රදේශයක යළි පිහිටුවන පවතින ව්‍යාවසායක ලාභ හා ආදායම කෙරෙහි අවුරුදු දහයක (10) කාලසීමාවක් සඳහා ආදායම් බදු පැනවීම, ගෙවීම හෝ අය කිරීම පිළිබඳව දේශීය ආදායම් පනතේ විධිවිධාන අදාළ නොවිය යුතුය.

එබඳු ව්‍යාවසායක් අවම වශයෙන් දේශීය පුද්ගලයන් දෙසීයක් (200) එහි සේවයේ යොදවන අතර, එහි යළි පිහිටවූ කම්හල/කම්හල්වල සේවයේ නියුක්ත නොකරන ලද සේවකයන්ට එම කාලයෙහි පවතින කම්කරු නියෝග අනුව හිමි සියළු සමාප්ති ප්‍රතිලාභ බේරුම් කළ යුතුය.

එකී සහන කාලසීමාව මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන තක්සේරු වසරක සිට ගණන් බැලිය යුතුය.

06–394

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.